**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර මතය

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම වන 1.6 ඡේදයේ ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලනකල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩ කාමර 18 කින් ලැබිය යුතු එක්වන් මුදල් රු.15,892,994 ක් හා ස්ථිර කාර්යය මණ්ඩලය සඳහා ගෙවන ලද වැටුප් සහ මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීමේදී පිළිවෙලින් අඩුවෙන් ප්‍රතිපූර්ණය වූ රු.86,126 ක් ලැබිය යුතු ලෙස හා වැඩියෙන් ප්‍රතිපූර්ණය වූ රු.36,784 ක් ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ආදායම් හා ප්‍රතිපූර්ණය වීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ප්‍රාග්ධන යෙදුමට අරමුදලින් දායකවීමේ ගිණුමේ වටිනාකම රු.8,978,081 ක් හා ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.1,068,026 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂවල වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයන්ට අදාළ ප්‍රාග්ධන ලැබීම් එකතු වටිනාකම වූ රු.816,446 ක් සමුච්චිත අරමුදලට බැර නොකර වර්ෂයේ ප්‍රාග්ධන ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ ආදායම පමණක් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ඉකුත් හා සමාලෝචිත වර්ෂයේ විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීම මත ප්‍රතිපූර්ණය නොවන වීථි පහන් නඩත්තු ගාස්තු රු.704,653 ක් ලැබිය යුතු ආදායමක් ලෙස වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රතිපූර්ණය නොවන ආදායම් ගිණුම්ගත නොකළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා ගිවිසුම්ගත වීමක් හෝ ඇණවුම් කිරීමකින් තොරව ස්වයංක්‍රීය විදුලි ස්විච් මිලදී ගැනීම වෙනුවෙන් රු.500,000 ක ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබීම නිසා වර්ෂය අවසානයේ ණයහිමි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිවිසුම්ගත වූ වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන වෙන්කළ යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලද රු.424,228 ක විනෝද බදු ආදායම් විවිධ තැන්පත් යටතේ වගකීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2017 වර්ෂයට අදාළව ලැබිය යුතු රු.295,940 ක විනෝද බදු ණයගැතියන් සඳහා ලබාදුන් චෙක්පත අගරු වීම ණයගැති ගිණුමට ගැළපීම් නොකර සමාලෝචිත වර්ෂයේදී නැවතත් ණයගැතියෙකු ඇති කිරීම නිසා වර්ෂය අවසානයේ ණයගැති ශේෂය එම අගයෙන් වැඩියෙන් දැක්වුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | එකතු වටිනාකම රු.186,771 ක් වූ පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ ලියාපදිංචි හෝටල් වලින් ලැබිය යුතු 1 % බදු ආදායම තුළ ඉකුත් වර්ෂයට අදාළව ලද රු.400,584 ක් ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ ආදායම එම වටිනාකමින්ම වැඩියෙන් දැක්වුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ ආදායම පමණක් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.10,716,661 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඇතැම් ශේෂ පෙර සිට පැවත එන බවත්, විස්තර සොයාගත නොහැකි බවත්, හඳුනාගත හැකි ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය | තිස්සමහාරාම පොදු වෙළඳපොළ අංක 40 සහ 41 කඩ බක්කි වලට යාබදව වර්ග අඩි 150 කින් යුත් අනවසර කඩ කාමරයක් ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කඩ කාමර කඩා ඉවත් කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (2) වගන්තිය | සභාවට අයත් වරිපනම් සීමාව පුළුල් කිරීම සඳහා 2013 හා 2018 යන වර්ෂයන් වලදී ග්‍රාම නිලධාරී වසම් 10 ක් දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබුණත් එම ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වරිපනම් බදු අයකිරීම සඳහා 2023 වර්ෂයේ සිට දියුණු කළ ප්‍රදේශ නම් කිරීමට කටයුතු කරන බව. | දියුණු කළ ප්‍රදේශ වලින් වරිපනම් අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වන වගන්තිය | 2007 වර්ෂයේදී සිදුකරන ලද තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකිරීම නිසා තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය අවුරුදු 12 ක් විය. | නව තක්සේරුවක්කර දෙනමෙන් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර තිබුණත් තක්සේරුවක් සිදු නොකළ බව. | නව තක්සේරුවක් මත වරිපනම් අයකළ යුතුය. |
| (ඈ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 02 (ඇ) (viii) ඡේදය | මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදෙනු ලබන ණය පහසුකම් අත්හිටුවීම සිදුකළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී සභාවේ ලේකම් වෙත ආපදා ණය, උත්සව හා විශේෂ අත්තිකාරම් ලෙස එකතුව රු. 264,000 ක ණය පහසුකම් ලබාදී තිබුණි. | ණය මුදල වාරික වශයෙන් අයකරන බව. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරන පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) චක්‍රලේඛයේ 06 ඡේදය | කඩ කාමර සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද තක්සේරු වාර්තා බලාත්මක කාල සීමාවලට අනුව තක්සේරුගත බදු කුලිය නව තක්සේරුවක් මඟින් සංශෝධනය කළයුතු වුවත්, සභාව සතු කඩ කාමර 418 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණු අතර විගණිත දිනට නව තක්සේරුවක් ක්‍රියාත්මක නොවූ කාලය මාස 92 ත් මාස 19 ත් අතර විය. | කඩ කාමර 23 ක් සඳහා නව තක්සේරුව ලද බවත්, ඉතිරි කඩ කාමර තක්සේරු කිරීම සඳහා ලිඛිතව දන්වා ඇති බව. | කඩ කාමර තක්සේරු කර නව කුලී අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,105,097 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,342,531 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,072,086 | 3,397,609 | 4,135,145 | 3,906,792 | 3,132,086 | 3,144,139 | 3,458,490 | 4,644,327 |
| කුලී | 16,694,830 | 13,701,423 | 18,337,271 | 3,931,896 | 15,139,002 | 14,083,204 | 14,810,927 | 8,567,744 |
| බලපත්‍ර ගාස්තු | 5,597,192 | 9,764,727 | 10,135,007 | 545,870 | 5,207,392 | 8,819,563 | 9,384,628 | 914,986 |
| වෙනත් ආදායම් | 15,633,000 | 24,751,809 | 24,298,145 | 18,889,968 | 12,249,876 | 11,661,818 | 11,360,192 | 1,435,304 |
| **එකතුව** | **40,997,108** | **51,615,568** | **56,905,568** | **27,274,526** | **35,728,356** | **37,708,724** | **39,014,237** | **15,562,361** |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | ඒකක 2120 කින් ලැබිය යුතු වරිපනම් බදු රු.3,181,852 ක් හා කඩ කාමර 233 කින් ලැබිය යුතු කුලී රු.3,363,325 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ පිළිවෙළින් 158 (1) හා 159(1) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු වරිපනම් බදු රු.119,890 ක් අයකර ගෙන ඇති අතර රු.5,000 ට වැඩි හිඟ සඳහා රතු නිවේදන යැවීමට හා කඩ කුලී රු.334,257 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | ව්‍යාපාර ඒකක 171 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු රු.429,000 ක් හා විනෝද බදු ආදායම් රු.295,940 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ව්‍යාපාර බදු රු..60,000 ක් අයවී ඇති බවත්, රු.85,800 ක් සඳහා නඩු පවරා ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | ලැබිය යුතු ගල් ක්‍රෂර් බදු ආදායම් රු.443,996 ක් ,වැසිකිළි බදු දීමෙන් රු.40,250 ක් හා නිවාස කුලී රු.84,325 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැසිකිළි බදු හිඟය කපා හැරීමට සහ ඉතිරි හිඟයන් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | තිස්ස පැරණි බස් නැවතුම්පළ ඉදිරිපිට ඇති අංක 03 කඩ කාමරය බදුගත් බදුකරු විසින් මාසිකව රු.1,500 ක් බැගින් රු.55,125 ක කඩකුලී ගෙවීමට කටයුතු කර නොතිබූ අතර බදුකරු සමඟ ලිඛිත ගිවිසුමකටද එළඹ නොතිබුණි. | හිඟ මුදල් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඉ) | ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු.139,800 ක් හා රථ වාහන නැවතුම්පොළ ගාස්තු රු.406,070 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැන්වීම් පුවරු ගාස්තු රු.122,200 ක් අයකර ගෙන ඇති බවත් වාහන නැවතුම්පොළ ගාස්තු 2022 වර්ෂයේ හිඟය කපාහැරීමට යොමුකිරීමටත් සහ ඉතිරි හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඊ) | සභාවේ ආදායම් පරීක්ෂක විසින් වාර්ෂික දැන්වීම් පුවරු සමීක්ෂණය නිවැරදිව සිදු නොකිරීම මත සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් නොවූ දැන්වීම් පුවරු 14 ක් වෙනුවෙන් ලැබිය යුතු ශේෂය රු.119,500 ක් විය. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව. | බිල් නොකළ ආදායම් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය. |
| (උ) | සභාවට ලැබිය යුතු ගලිබවුසර් සේවා ගාස්තු ,වාහන කුලියට දීමෙන් හා කසළ ඉවත් කිරීමෙන් ගාස්තු පිළවෙලින් රු.68,225, රු.460,395 ක් හා රු.304,450 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගලිබවුසර් හිඟයෙන් රු.56,100 ක් හා කසළ ඉවත් කිරීමෙන් රු.48,750 ක් අයවී ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඌ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,777,667 ක් හා රු.22,601,844 ක් විය. | මුද්දර ගාස්තු හිඟයෙන් රු.5,000,000 ක් සහ උසාවි දඩ හිඟය අයවී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාථරීක ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පන්නෙගමුව පොදු වෙළඳපොළ තුළ නව වෙළඳ සංකීර්ණය කඩකාමර 28 ක් හා විවෘත ගොඩනැගිල්ලක් රු.62,915,634 ක වියදමකින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිකර 2021 වර්ෂයේ සභාව වෙත භාරදී තිබූ අතර, විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 11 දින වන විටත් ප්‍රයෝජනයට නොගැනීම නිසා ගොඩනැගිලි පරිශ්‍රය තුළ වල් බිහිවී ඇඩි ලෙස අපවිත්‍ර වී තිබුණි. මෙය මහජන මුදල් නාස්තියක් හා සභාවට ලැබිය හැකිව තිබූ ආදායම් අත්හැරීමට කටයුතු කිරීමක් විය. | තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර එය ලැබුණු පසු කඩ කාමර විවෘත කිරීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් වලින් උපරිම ප්‍රතිඵල ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කඩකාමර 48 කින් යුත් බිම් මහලද, ප්‍රාදේශීය සභා කාර්යාලය පවත්වාගෙන යාම සඳහා පළමු මහලද, රැස්වීම් ශාලාව සඳහා දෙවන මහලද සහිතව නාගරික සංවර්ධන අධිකාරිය විසින් තිස්සමහාරාම බස්නැවතුම්පොළ අසළ ඉදිකර තිබූ මෙම ගොඩනැගිල්ල 2019 දෙසැම්බර් 02 දින ප්‍රාදේශීය සභාව වෙත භාරදී තිබුණි. කඩකාමර 48 පිහිටි බිම් මහලෙහි වැඩ සම්පූර්ණයෙන්ම නිමකර තිබූ අතර අනෙක් මහල් දෙකෙහි ඉදිකිරීම් කටයුතු වලින් සැලකියයුතු ප්‍රමාණයක් නිමකර තිබුණි. ගොඩනැගිල්ල සභාවට භාරදී වසර 04 ක් ගතවී තිබුණද කඩකාමර බදුදී ආදායම් ඉපැයීමට කටයුතු කර නොතිබූ අතර අනෙක් මහල් දෙකෙහි වැඩ නිමකර ප්‍රයෝජනයට ගැනීමටද කටයුතු කර නොතිබුණි. | දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය ලබාගෙන ඉදිකිරීම් කටයුතු නිම කරන බව. | ඉදිකිරීම් කටයුතු නිමකර ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගතයුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2017 නොවැම්බර් 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 (XXXIII) ප්‍රකාරව ප්‍රවාහන පහසුකම් සපයන නිලධාරීන්ට කාර්යාලය සහ නිවස අතර ගමන් කළ හැකි උපරිම දුර ප්‍රමාණය කිලෝමීටර් 50 නොඉක්ම විය යුතු වුවත්, එපරිදි කටයුතු නොකර සභා ලේකම් විසින් දිනකට යාමට සහ ඒමට කිලෝමීටර් 100 ඉක්මවා ප්‍රවාහන පහසුකම් සලසාගෙන තිබුණි. 2020 නොවැම්බර් 02 දින සිට 2023 ඔක්තෝබර් 02 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දිනකට කිලෝමීටර් 100 ඉක්මවා ධාවනය කර තිබූ කිලෝමීටර් 19272 ක් සඳහා සභා අරමුදලින් රු.323,403 ක අතිරේක ඉන්ධන පිරිවැයක් දරා තිබුණි. | චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට පටහැනිව කටයුතු කර සභා අරමුදලට සිදුකර ඇති පාඩුව වගකිවයුතු පාර්ශවයෙන් අයකළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| අනුමත ප්‍රමාණය ඉක්මවා කළ ගොඩනැගිලි ඉදිකිරීම් සැලසුම් 09 කට අදාළව හා නියමිත කාලය තුළ ඉදිකිරීම් සිදු නොකළ ගොඩනැගිලි සැලසුම් 06 කට අදාළව, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතට 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් කරනු ලැබූ සංශෝධන අනුව අයකළ යුතු පිළිවෙළින් රු.1,311,699 ක හා රු.30,000 ක ආවරණ අනුමැතිය ලබාදීමේ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පෙරසැරි ගාස්තු අයකර සංශෝධිත සැලසුම් ලබා දීමට කටයුතු කරන බව හා වලංගු කාලය දීර්ඝ කිරීමේ ගාස්තු අයකරන බව. | පනතේ හා සංශෝධිත ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | එකතු කළ අගය මත බදු (VAT) අය කිරීම සඳහා වලංගු ලියාපදිංචියක් නොමැතිව සභාව විසින් 2023 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර නිකුත් කිරීමේදී එකතු කළ අගය මත බදු රු.24,224 ක් අයකර තිබුණි. | ගාස්තු සංශෝධනය කර අයකිරීමට කටයුතු කර ඇති බව. | එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී නොමැති විට එම බදු අයනොකළ යුතුය. |
| (ආ) | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 46 ක් සඳහා ඒවා ලබාදීමට කටයුතු නොකිරීම මත ලැබිය යුතු රු.227,700 ක පරිසර බලපත්‍ර ගාස්තු ආදායම් අයකර ගැනීම කෙරෙහි සභා කළමනාකාරීත්වයේ අවධානය යොමුවී නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගන්නා ලෙස අදාළ පාර්ශවයන් දැනුවත් කළ බව. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදී ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | විවිධ හේතුමත 2023 පෙබරවාරි මස ටෙන්ඩර් නොකල කඩ කාමර 07 ක් පැවති අතර ඒවා ඌන උපයෝජිතව පැවති කාලය සමාලෝචිත වර්ෂයේ අවසානයට මාස 10 ක් විය. | විදුලි සම්බන්ධතාවය ලබාදීමෙන් පසු මෙම කඩකාමර ටෙන්ඩර් කරන බව. | කඩ කාමර බදු දීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව භුක්ති විඳින වාහන හා යන්ත්‍ර උපකරණ 03 ක සහ ඉඩම් හා ගොඩනැගිලි 39 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගත යුතුය. |

### 3.6 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට වාර්ෂික අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන වෙන් කර තිබූ එකතු වටිනාකම රු.37,500,000 ක් වූ සංවර්ධන යෝජනා 04 ක් වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව. | අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර ඇති සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.7 ප්‍රසම්පාදන කළමණාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 වගන්තියේ සඳහන් විධිවිධාන වලින් බැහැරව සිසු නිපුණතා වැඩසටහන සඳහා ත්‍යාග ලබාදීම හදිසි ප්‍රසම්පාදනයක් ලෙස සලකා එකතුව රු.140,250 ක පිටු 120 CR පොත් 830ක් සහා අරමුදලින් මිලදීගෙන තිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ 174 අනුව කටයුතු කර ඇති බවත් ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 (අ) වගන්තිය අනුව ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩ හෝ වැඩ සඳහා පිරිවිතර අදාළ ප්‍රසම්පාදන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා පටු ආකාරයට විස්තර නොකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී එකතු වටිනාකම රු.413,195 ක් වූ ටයර් 06 ක් මිලදී ගැනීමේදී එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සභා අරමුදලින් බොරළු යොදා ග්‍රාමීය මාර්ග 05 ක් සංවර්ධනය කිරීම සඳහා නිවැරදි මිලගණන් භාවිතා නොකිරීම නිසා රු.1,276,037 ක් වැඩිපුර ඇස්තමේන්තුකර තිබුණි. | දෙවරක් බොරළු පැටවීම සඳහා මිල ගණන් ඇතුළත් කර ඇති බව. | ඇස්තමේන්තු සකස් කිරීම නිවැරදිව කළ යුතුය. |
| (ආ) | බොරළු යොදා සංවර්ධනය කර තිබූ මාර්ග ව්‍යාපෘති 05 ක් සඳහා බොරළු පස්_ප්‍රවාහන ටිපර් රථ සඳහා ගෙවීම් කිරීමේදී මාර්ග මිලගණන් ලේඛනයේ සඳහන් මිල ගණන් යොදා නොගෙන මිලගණන් කැඳවීම තුළින් ලබාගත් මිලගණන් පදනම් කරගෙන ගෙවීම් කිරීම නිසා සභා අරමුදලින් රු.400,413 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ටිපර් රථ වලින් මිල ගණන් කැඳවා අවම මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරු තෝරාගත් බව. | වැඩිපුර ගෙවා ඇති ප්‍රවාහන ගාස්තු අයකරගත යුතුය. |

**3.9 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 104 ක් හා 90 ක් වූයෙන් තනතුරු 08 කට අදාළ අතිරික්තතා 18 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරන බව. | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරණ රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් වූ ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (vii) ඡේදයේ සඳහන් විධිවිධාන වලින් බැහැරව තාවකාලික සෞඛ්‍ය කම්කරුවන් 05 දෙනෙකු අනුමැතියකින් තොරව බඳවාගෙන 2023 වර්ෂයේ මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වා රු.999,701 ක් වැටුප් ගෙවා තිබුණද සභාවේ සෞඛ්‍ය කම්කරුවන් 22 ක අතිරික්තතාවයක් පැවතුණි. | සේවා අවශ්‍යතාවය මත බඳවා ගැනීම් සිදුකර වැටුප් ගෙවීම් කළ බව. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 3.10 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| කසල බැහැර කිරීම සඳහා උද්ධකන්දර ග්‍රාම නිලධාරී වසම තුළ අක්කර 20 ක බිම් කොටසක් ලබාදෙන ලෙස 2022 වර්ෂයේදී සභාවේ සභාපතිවරයා විසින් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමක් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් මෙම ඉඩම සභාව වෙත පවරා දී නොතිබුණි. පවරාදී නොතිබියදී සභාව විසින් රැගෙන එනු ලබන කසළ සහ ගලි අපද්‍රව්‍ය මෙම භූමියට අවිධිමත්ව බැහැර කිරීම සහ සභාවේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා බොරළු කැපීම මෙම ඉඩමෙන් සිදුකර තිබුණි. | ඉල්ලීම් කළ භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.6122 ක් පැවරුම් කිරීමට ප්‍රාදේශීය ලේකම් එකඟතාවය පලකර ඇති බව. | අවිධිමත්ව කසළ බැහැර කිරීම සහ පස් කැපීම නොකළ යුතුය. |